නුවරඑළිය මහා නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 19 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 29 දිනද සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නව සීමා නිර්ණය හේතුවෙන් සභා බල ප්‍රදේශයෙන් ඉවත් වූ දේපලවලට අදාළ වරිපනම් බදු බිල්කිරීම සහ වරිපනම් බදු හිඟය හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ii) | සභාව විසින් නුවරඑළිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,684,569 ක ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ ඉඩම් බදු ආදායම රු.3,855,516 ක් වුවද එය රු.6,435,613 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය තුළ වැට් බදු ගෙවීමේදී ඉඩදිය හැකි යෙදවුම් බද්ද රු.4,533,856 ක් අදාළ වැය | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

ශීර්ෂයට බැර කළ යුතු වුවද අය ශීර්ෂයකට බැර කර තිබුණි.

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 06 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.1,714,676 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

විගණන නිරීක්ෂණය.

කර්මාන්ත ණයගැතියෝ රු.128,428,098 ක් කපා හැරීමට අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 04 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.4,518,252 ක් වූ ලැබිය යුතු ශේෂයන් අයකර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 ඉක්ම වූ රු.20,894,764ක් වූ | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි.

1.5 අනුකූල නොවීම්
-------------------
නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
------------------------------------------------------------------------

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සහා ආඥා පනතේ 187 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් රු.40,783,333 ක මුදලක් පෞද්ගලික වානිජ බැංකුවක ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. | ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ආ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ව) නියෝග | සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 2019 අප්‍රේල් වන විටද මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | අදාළ නියෝග පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්ති | සභාවේ තාවකාලිකව සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ, විශ්‍රාමික හා මියගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිළධාරීන්/ සේවකයින් 68 දෙනෙකුගෙන් වසරකට අධික කාලයක සිට අයවිය යුතුව පවතින ණය හා අත්තිකාරම් රු.1,512,934 ක් අයකර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ණය හා අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2), 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 14 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.1,641,945 ක අතුරු අග්‍රිම මාස 06 සිට 58 දක්වා කාල පරාසයක් ගතවී ඇතත් පියවා නොතිබුණි. | අදාළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම, මුදල් රෙගුලාසි මුදල් චක්‍රලේඛ සහ මූල්‍ය රීති ප්‍රකාරව පියවා ගත වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | අවස්ථා 09 කදී මාණ්ඩලික තත්ත්වයේ නොවන නිළධාරීන්ට රු.437,750 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | අදාළ නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| | | තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල වූ රු.100,000 ක් ඉක්මවා අවස්ථා 02 කදී රු.596,500 ක මුදලක් ලබාදී තිබුණි. | අදාළ සීමාවන් තුල පමණක් අග්‍රිම ලබා දිය යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 | 2014 – 2017 අතර කාලය තුළ අවස්ථා 07කදී සභාවට ආදායම් වශයෙන් ලැබී අගරු වී තිබුණු චෙක්පත් 07 ක වටිනාකම රු.178,916 ක් අයකරගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අගරු චෙක්පත්වල වටිනාකම අයකර ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඊ) | මුදල් රෙගුලාසි 571 (3) | තැන්පත් කර වසර 02 සිට වසර 11 දක්වා කාල පරාසයක් ඉක්මවා ඇති රු.8,738,452 ක් වටිනා තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (උ) | 2016.12.29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 42 ක 2017 වර්ෂයට පසු ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අදාළ කාල සීමාවන් තුලදී ඉන්දන දහන පරීක්ෂාව සිදු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.118,906,163 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.107,228,622 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 99,068,258 | 86,939,615 | 84,830,288 | 94,065,436 | 82,248,792 | 86,961,780 | 82,637,247 | 93,255,272 |
| කුලී | 91,634,275 | 55,030,277 | 53,153,903 | 43,300,208 | 83,038,586 | 48,619,605 | 47,505,781 | 40,637,959 |
| බලපත්‍ර ගාස්තු | 23,572,000 | 20,787,120 | 19,900,958 | 1,421,860 | 22,712,000 | 22,350,622 | 22,204,028 | 1,424,360 |
| වෙනත් ආදායම් | 169,848,000 | 126,584,810 | 134,978,554 | 40,306,647 | 157,353,000 | 157,989,575 | 144,979,163 | 194,695,830 |
| | 384,122,533 | 289,341,822 | 292,863,703 | 179,094,151 | 345,352,378 | 315,921,582 | 297,326,219 | 330,013,421 |

### 2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.63,667,302 ක් වූ හිඟයෙන් වර්ෂය තුළ අයකිරීම රු.18,560,026 ක් එනම් 29% ක් පමණ අඩු මට්ටමක පැවති අතර දඩ මුදල්ද ඇතුළුව සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු.42,102,008 ක් වූ අතර අයකිරීම රු.27,948,458 ක් එනම් 66% ක් විය. | ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කර හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

#### උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.978,326 ක උසාවි දඩ හා රු.38,088,328 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | උසාවි දඩ සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

-------------------

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | මහා නගර සභා ආඥා පනතේ 267 (1) වගන්තිය අනුව ග්‍රෙගරි වැව උද්‍යානයේ විනෝද බදු, වසන්ත උත්සව සමයේ සැණකෙළි පැවැත්වීම, ප්‍රචාරක කටයුතු, අශ්වයින් පෝනින් වැනි සතුන් විනෝද කටයුතු සඳහා යොදාගැනීම, මෝටර් රථ වාහන නවතා තැබීමේ ස්ථාන නියම කිරීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා විධිමත්ව ආදායම් උපයාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | සභාවට ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයාගත ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී |
| ii. | මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ දැක්වෙන අවස්ථා පිළිබඳව අතුරු ව්‍යවස්ථා පැනවිමට කටයුතු නොකිරීම හේතුවෙන් නගරයේ විධිමත් පාලනයට බලපෑම් ඇතිවීම, යහපාලනය, විනිවිදභාවය පිළිබඳ ගැටළු, මහජන පීඩා වැළැක්වීමට ක්ෂණික පියවර ගැනීමේදී නීතිමය බාධා ඇතිවීම වැනි අහිතකර තත්ත්වයන් ඇතිවී තිබුණි. | මහා නගර සභා ආඥාපනතේ විධිවිධාන අනුව අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ . | ඉදිරියේදී නිවැරදි කරමී. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්ය භාරයක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ . | ඉදිරියේදී නිවැරදි කරමී |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු උඩුපුස්සැල්ලාව පාර නව වෙළඳ සංකීර්ණයේ ඉදිකර ඇති කඩකාමර 16 ක් 2014 සිට වසර 30 ක කාලයක් සඳහා දීර්ඝකාලීනව බදු දී තිබුණු අතර බදුකරුවන් දෙදෙනෙකු සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. අදාළ බදු ගිවිසුම් අනුව තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කරන මාසික බදු මුදල ගෙවීමට බදුකරුවන් එකඟ වී තිබුණද 2016 ජූනි 23 දිනැති තක්සේරු වාර්තාව අනුව තක්සේරු කරන ලද මාසික බදු මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද අයකර නොතිබීම නිසා 2014 ජූලි සිට 2018 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ලැබිය යුතු රු.1,680,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | අදාළ බදු ගිවිසුම් අනුව කටයුතු කර සභා අරමුදලට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වන උප වගන්තිය අනුව උපලේඛනගත නිවාස ලබාගැනීම වෙනුවෙන් සභාවේ සේවයේ නියුතු නිලධාරියෙකුගෙන් සහ සභාවේ සේවය කොට ස්ථාන මාරුවීම් ලැබූ නිළධාරීන් දෙදෙනෙකුගෙන් 2016 මැයි සිට 2018 දෙසැම්බර් දක්වා කාලයට අදාළව අයවිය යුතු කුලී රු.223,761 ක් අයකරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාස කුලී අයකර ගත යුතු වේ . | ඉදිරියේදී නිවැරදි කරමී |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු බඹරකැලේ පිහිටි අක්කරයක පමණ වපසරයකින් යුත් ගල්වල 2008 දෙසැම්බර් 02 සිට 2013 දෙසැම්බර් 01 දක්වා කාලය සඳහා පුද්ගලයෙකුට බදු දී තිබුණු අතර ගිවිසුම් කාලය අවසන් වී වසර 05 ක් ගත වී ඇතත් ගිවිසුම අළුත්කර ගාස්තු අයකර ගෙන යාම හෝ නැවත සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. බදුගත් තැනත්තා විසින් පෙර කොන්දේසිද කඩ කරමින් අදාළ භූමියේ ස්ථිර ඉදිකිරීම් සිදුකර ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යමින් තිබුණි. | නැවත සභාවට පවරා ගැනීම හෝ ගිවිසුම් අළුත්කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 34 ක පුරප්පාඩු 150 ක් විය. | අදාළ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි |
| (ආ) | කම්කරු තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව 60 ක් වුවද අනියම්/ ආදේශක සේවකයින් 104 ක් සේවයේ යොදවාගෙන රු.37,726,972 ක වැටුප් ගෙවා තිබුණි. | ප්‍රශස්ථ ලෙස මානව සම්පත් කළමනාකරණය කර ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017.12.08 දිනැති අංක 2049 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් 2018 වර්ෂය සඳහා සෑම චිත්‍රපටි දර්ශනයක් සඳහාම ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 25% ක විනෝද බද්දක් අයකරන බව ප්‍රකාශයට පත්කර තිබුණද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක බද්දක් අයකර තිබුණු බැවින් සභා අරමුදලට ලැබිය යුතු රු.1,425,308 ක විනෝද බදු ආදායමක් අහිමිව තිබුණි. | නියමිත පරිදි විනෝද බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

| | | |
|---|---|---|
| (ආ) සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපොල 2007 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී |

3.5 වත්කම් කළමනාකරණය
-----------------------------

3.5.1 නිශ්කාර්ය වත්කම්
---------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 06 ක් වසර 01 සිට වසර 05 දක්වා කාල පරාසයක් නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමී. |